# Gampaha Wickramarachchi University of Indigenous Medicine, Sri Lanka
## ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
## පුරප්පාඩු

### විවෘත අයදුම්පත් කැඳවීම

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අයදුම්පත් යොමු කිරීම සඳහා උපදෙස්**

1. අයදුම්පත් **මාර්ගගත ක්‍රමවේදය (online application portal) ඔස්සේ පමණක්** ඉදිරිපත් කළ යුතු අතර අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා මාර්ගගත ද්වාරය **gwu.ac.lk** වෙබ් අඩවියේ **vacancies** යටතේ ඉදිරිපත් කර ඇත. **මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි දෘඪ පිටපතක්,** බාගත කර **(Download)** අයදුම්කරු විසින් අත්සන් කර **2026.03.05** වන දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් **සහකාර ලේඛකාධිකාරි, ආයතන අනධ්‍යන අංශය, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, නුවර පාර, යක්කල** යන ලිපිනයට එවීමට පියවර ගත යුතුය.

2. වෙබ් අඩවියේ දක්වා ඇති **online application portal** වෙත පිවිසීමට ප්‍රථම, වෙබ් අඩවියේ පළකර ඇති දැන්වීම මගින් ඉල්ලා ඇති සියලු ලේඛනවල මෘදු පිටපත් කලින් සූදානම් කර ගත යුතු අතර, **GWUIM RMS User Guide** මගින් දක්වා ඇති උපදෙස් පිළිවලින් අනුගමනය කොට ඔබගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.

3. අයදුම්කරුවන් විසින් නැවත නොගෙවනු ලබන රු. **750/-** ක අයදුම්පත් හා විභාග ගාස්තුවක් ගෙවිය යුතු වන අතර, එය **333-1001-1- 0000059** (මහජන බැංකුව, යක්කල ) ගිණුම් අංකයට බැර කොට, අදාල රිසිට්පතෙහි මෘදු පිටපත මාර්ගගත ක්‍රමවේදයේ දක්වා ඇති පරිදි **PDF** ලෙස උඩුගත **(upload)** කළ යුතු වේ. එහි මුල් පිටපත අයදුම්පත සමඟ එවිය යුතු වේ.

4. මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා වූ පද්ධතිය **(online application portal) 2026.02.16** දින සිට **2026.03.05** දින දක්වා විවෘතව පවතිනු ඇත. තාක්ෂණික ගැටළු හෝ විමසීම් වේ නම් 077 8656171 හෝ 033 2 222748 දුරකථන අංකවලට ( රාජකාරි දිනවල පෙ.ව 8. 30 am – ප.ව. 4.00 pm) ඇමතිය හැකිය.

5. අයදුම්පත්‍රය බහාලන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර පැහැදිලිව සඳහන් කිරීම අත්‍යාවශ්‍ය වේ.

6. අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලි වීම, සුදුසුකම් සනාථ කිරීමට අදාළ සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා නොතිබීම, මුදල් ගෙවූ ලදුපත අමුණා නොතිබීම සහ අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ. කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ නැවත සලකා බලනු නොලැබේ.

1. **ඖෂධවේදී (පහළ ශ්‍රේණිය)**

**අවශ්‍ය සුදුසුකම් :** සුදුසුකම්ලත් ඖෂධවේදියෙකු වශයෙන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවෙන් (Sri Lanka Medical Council) පිළිගනු ලබන සහතිකයක් ලබා තිබීම.

**වැටුප් පරිමාණය : U-MT 1 (III) - රු.51,095-7X540;10X640-60,575 (මාසික)**
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ)

**බඳවා ගැනීම :** සම්මුඛ පරීක්ෂණයක් මඟින්

වයස :අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය

2. **තාක්ෂණික නිලධාරි (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය) III ශ්‍රේණිය**

**අවශ්‍ය සුදුසුකම් :** (a) අ.පො.ස.(උ/පෙළ) විභාගයේ ඕනෑම විෂය ධාරාවක් යටතේ එකවර විෂයයන් තුනක් (03) සමත්වී තිබියයුතුය.

සහ

(b) තොරතුරු සන්නිවේදන හා බහු මාධ්‍ය තාක්ෂණය/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය/ තොරතුරු තාක්ෂණය ක්ෂේත්‍රයේ හෝ ඊට සමාන ක්ෂේත්‍රයක තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයකින් හෝ පිළිගත් ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකමේ 5 වන මට්ටම (NVQ Level 5) හෝ ඊට නොඅඩු මට්ටමක ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.

- තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සේවා පළපුරුද්ද ඇති අයදුම්කරුවන් කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

❖ ඉහත සඳහන් කළ සුදුසුකම්වලට අමතරව අයදුම්කරුවන් පහත සඳහන් නිශ්චිත සුදුසුකම් ලබා තිබිය යුතුය.

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය
- වයස අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය
- මනා චරිතයක් තිබිය යුතුය

**වැටුප් පරිමාණය :UMT 1 (III) - රු.51,095-7X540;10X640-60,575 (මාසික)**
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ)

**බඳවා ගැනීම :** ලිඛිත හා / හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

## 3. කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) III ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම් :** 1. අ.පො.ස.(සා/පෙළ) විභාගය පහත සඳහන් විෂයන්වලට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06ක් එක් වරකදී සමත්වී තිබීම.

(i) සිංහල භාෂාව / දෙමළ භාෂාව

(ii) ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍යය

(iii) ගණිතය

සහ

2. අ.පො.ස.(උ/පෙළ) විභාගය එක් වරකදී සියලු විෂයයන් සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

**පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.**

(a) පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 06 කට නොඅඩු පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක් තිබීම.

සහ

(b) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක (02) ක පළපුරුද්දක් තිබීම.

**තනතුරට විශේෂ වූ සුදුසුකම්**

ඉහතින් දක්වා ඇති සුදුසුකම් වලට අමතරව අයදුම්කරුවන් කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) තනතුරට විශේෂ වූ පහත සුදුසුකම් සපුරාලිය යුතුය.
ගබඩාකරණය පිළිබඳ අවම වශයෙන් වසරක පළපුරුද්ද සහ/හෝ අ.පො.ස.(සා.පෙළ) විභාගයේදී වාණිජ්‍ය විෂය සමත්ව තිබීම හෝ අ.පො.ස.(උ.පෙළ) විභාගයේදී ගිණුම්කරණය විෂය සමත්ව තිබීම.

සටහන:- විශ්වවිද්‍යාලය විසින් තීරණය කරනු ලබන පරිදි තෝරාගනු ලබන අයදුම්කරුවන් විසින් ආරක්ෂක තැන්පතුවක් (Security Deposit) තැබිය යුතුය.

**වැටුප් පරිමාණය :UMN 1 (III) - රු. 49,475 – 17x540 – 58,655 (මාසික)**
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ)

**බඳවා ගැනීම :** ලිඛිත පරීක්ෂණයක් (ලකුණු 75%) සහ සම්මුඛ පරීක්ෂණයක් (ලකුණු 25%) මඟින්
ලිඛිත පරීක්ෂණ විභාගය පහත විෂයන්ගෙන් සමන්විතය

- සිංහල/ දෙමළ හා ඉංග්‍රීසි භාෂා දැනුම
- බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම
- පරිගණක දැනුම
- නියමිත විෂය දැනුම

ඉහත සඳහන් කළ සුදුසුකම්වලට අමතරව අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් ලබා තිබිය යුතුය.

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය
- වයස අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය
- මනා චරිතයක් විය යුතුය

4. <u>කළමනාකරණ සහකාර (පොත් තබන්නා) III ශ්‍රේණිය</u>

**අවශ්‍ය සුදුසුකම් :** 1. අ.පො.ස.(සා/පෙළ) විභාගය පහත සඳහන් විෂයන්වලට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06ක් එක් වරකදී සමත්වී තිබීම.

(i) සිංහල භාෂාව / දෙමළ භාෂාව
(ii) ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍යය
(iii) ගණිතය

සහ

2. අ.පො.ස.(උ/පෙළ) විභාගය එක් වරකදී සියලු විෂයයන් සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

**පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.**

(a) පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 06 කට නොඅඩු පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක් තිබීම.

සහ

(b) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක (02) ක පළපුරුද්දක් තිබීම.

<u>තනතුරට විශේෂ වූ සුදුසුකම්</u>

(a) නිපුණතා සංවර්ධනය හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික විද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා තාක්ෂණ විද්‍යාලයකින් ලබාගත් ගණකාධිකරණ ශිල්පය පිළිබඳ ජාතික සහතික පත්‍රය හෝ පිළිගත් ආයතනයකින් පිරිනමනු ලබන ඒ හා සමාන සුදුසුකමක් තිබීම.

හෝ

(b) අ.පො.ස.(උ.පෙළ) විභාගය වාණිජ්‍ය විෂය ධාරාවෙන් සමත්වීම.

වැටුප් පරිමාණය : **UMN 1 (III) - රු. 49,475 – 17x540 – 58,655 (මාසික)**

(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ)

බඳවා ගැනීම : ලිඛිත පරීක්ෂණයක් (ලකුණු 75%) සහ සම්මුඛ පරීක්ෂණයක් (ලකුණු 25%) මගින් ලිඛිත පරීක්ෂණ විභාගය පහත විෂයන්ගෙන් සමන්විතය

- සිංහල/ දෙමළ හා ඉංග්‍රීසි භාෂා දැනුම
- බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම
- පරිගණක දැනුම
- නියමිත විෂය දැනුම

ඉහත සඳහන් කළ සුදුසුකම්වලට අමතරව අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් ලබා තිබිය යුතුය.

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය
- අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය
- මනා චරිතයක් විය යුතුය

## 5. ආරක්ෂක පරීක්ෂක II ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම් :**

1. අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06 කින් සමත් වීම සහ සිංහල භාෂාව / දෙමළ භාෂාව හෝ සාහිත්‍යය සහ ගණිතය යන විෂයන් ඇතුලුව සම්මාන සාමාර්ථ 05 ක් තිබිය යුතුවේ.
2. පොලිස් හෝ හමුදා සේවයේ හෝ විශ්වවිද්‍යාල පද්ධතියේ ආරක්ෂක සේවයේ හෝ පිළිගත් ආරක්ෂක සේවයක අවම වශයෙන් වසර 5 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.
3. ක්‍රීඩා කටයුතුවල ක්‍රියාකාරීව සහභාගී වී තිබිය යුතුය.
4. උස - අඩි 5 අඟල් 4 නොඅඩු විය යුතුය.
5. පපුව - අඟල් 34 ට නොඅඩු විය යුතුය.
6. අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය : **UMN 1 (III) - රු. 49,475 – 17x540 – 58,655 (මාසික)**
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ)

බඳවා ගැනීම: සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

## 6. රියදුරු (III ශ්‍රේණිය)

**අවශ්‍ය සුදුසුකම් :**

a). අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06 කින් සමත් වීම සහ සම්මාන සාමාර්ථ 02 ක් තිබිය යුතුවේ.

සහ

b). මෝටර් රථ කොමසාරිස් ජෙනරාල් විසින් නිකුත් කරන ලද බර වාහන සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම සහ එම බලපත්‍රය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර (03) රියදුරු පළපුරුද්දක් තිබීම.

වයස : අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

- සියළුම අයදුම්කරුවන්,

(i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
(ii) තනතුරේ රාජකාරි හොඳින් ඉටුකිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
(iii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

වැටුප් පරිමාණය: **U-PL 3 (III) රු.48,005 – 16 x 490 – 55,845 (මාසික)**
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ)

බඳවා ගැනීම: ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හා වෘත්තීය පරීක්ෂණයක් මඟින්.

**7. <u>විදුලි කාර්මික (III ශ්‍රේණිය)</u>**

**අවශ්‍ය සුදුසුකම් :**

1 තනතුරුට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු සුදුසුකම් ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. (පාඨමාලාවට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ Level) තහවුරු කිරීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කළ යුතුය.

**වයස** : අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

- සියළුම අයදුම්කරුවන්,

(i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
(ii) තනතුරේ රාජකාරි හොඳින් ඉටුකිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
(iii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

වැටුප් පරිමාණය: **U-PL 3 (III) රු.48,005 – 16 x 490 – 55,845 (මාසික)**
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ)

බඳවා ගැනීම : වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

බී.ඒ.එන්.ක්‍රිෂාන්ත
ලේඛකාධිකාරි
2026.02.12